**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කොමිෂන් සභාව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, කොමිෂන් සභාවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය, ශුද්ධ මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමට පෙර රු. මිලියන 352.5 ක ඌණතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේදී ඌණතාවය රු.මිලියන 385.2 ක් ලෙස වාර්තා විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඌණතාවය රු. මිලියන 32.7 කින් හෙවත් සියයට 8.4 කින් අඩු වීම සඳහා මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ ලැබුණු ප්‍රදානය රු.මිලියන 93.1 කින් වැඩිවීම ප්‍රධාන හේතුව විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

----------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර පහත පරිදි දක්වා ඇත.

| | 2021 | 2020 | වෙනස ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු. | රු. | |
| **කොමිෂන් සභාවේ ආදායම** | | | |
| පොලී ආදායම | 1,820,617 | 5,360,805 | (66.0) |
| රජයේ ප්‍රදාන (මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය) | 104,804,128 | 11,720,560 | 794.2 |
| **කොමිෂන් සභාවේ වියදම්** | | | |
| සේවක වැටුප් | 148,971,963 | 132,419,676 | 12.4 |
| විශේෂ ගෙවීම් | 18,085,294 | 16,606,045 | 8.9 |
| සේවක වාහන දීමනා | 26,662,653 | 23,298,500 | 14.4 |
| සේවක වෛද්‍ය වියදම් හා රක්ෂණය | 15,350,619 | 7,914,882 | 93.9 |
| සේවක සුබසාධනය | 7,335,081 | 4,052,758 | 80.9 |
| විදේශීය පුහුණුව සහ සංචාර | 0 | 2,309,872 | (100.0) |
| කුලී සහ කාර් පාක් කුලී | 101,143,670 | 96,216,435 | 5.1 |
| ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධන වියදම් - එකතුව | 55,241,934 | 32,376,005 | 70.6 |
| • ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනය | 14,862,714 | 16,920,166 | (12.1) |
| • මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 24,840,257 | 1,354,648 | 1,733.7 |
| • අධ්‍යාපන වැඩසටහන් | 1,802,431 | 1,609,193 | 12.0 |
| • ජාත්‍යාන්තර සාමාජිකත්ව ගාස්තු - අයි.ඕ.එස්.සී.ඕ | 4,210,388 | 3,684,862 | 14.2 |
| • ප්‍රසිද්ධිය සහ ප්‍රචාරණය | 146,664 | 0 | 100 |
| • වෙළඳපොල පරීක්ෂණ පිරිවැය | 9,349,152 | 8,795,002 | 6.3 |

අ. ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස, ප්‍රතිඵල මූලික මූල්‍යකරණ සංරචකය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 2 ක් හා ආයෝජන මූලික මූල්‍යකරණ සංරචකය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 8 ක් වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 10 ක් ලබා ගැනීමට කොමිෂන් සභාව හිමිකම් ලබයි. සමාලෝචිත වර්ෂය අවසානයේදී, කොමිෂන් සභාවට එකතුව රු. මිලියන 197.68 ක් (2019 දී රු. 81,124,254 ක්, 2020 දී රු. 11,720,560 ක් හා 2021 දී රු.මිලියන 104,804,128 ක් වශයෙන්) ක් ප්‍රතිඵල මූලික මූල්‍යකරණ සංරචකයේ කොටසක් ලෙස ලැබී තිබුණි. ලබා ගැනීමට හැකිවූ තොරතුරුවලට අනුව,

ව්‍යාපෘතියේ මූල්‍යාකරණ ගිවිසුමේ සඳහන් වියදම් සම්බන්ධ දර්ශක 4.1 යටතේ ළඟාකර ගැනීමට අවශ්‍ය භාරදීමට එරෙහිව ගෙවීම (DvP) හි සාංගමික හිමිකම් කාණ්ඩයේ පියවීම් සක්‍රීය කිරීමට අවශ්‍යවන මධ්‍යම තැන්පතු ක්‍රමයේ හා වෙනත් රීතිවල සංශෝධන කොමිෂන් සභාව අනුමත කර ඇත. කෙසේ වෙතත්, කොළඹ කොටස් හුවමාරු ව්‍යාපාර අඛණ්ඩ සැළසුම්කරණ (BCP) පරීක්ෂා කිරීමට අදාල වියදම් සම්බන්ධ අනිකුත් දර්ශක දෙකක් වන, සම්පූර්ණ කළ භාරදීමට එරෙහිව ගෙවීම පහසුකම හා භාරදීමට එරෙහිව ගෙවීම ක්‍රමය සක්‍රීය කර වසරකට පසු එය සිදුවන බව තහවුරු කිරීමට ස්ථානීය හා ස්ථානීය නොවන පරීක්ෂණ/ විගණනයන් කොමිෂන් සභාව බාර ගැනීම ඇතුළත්වන කොළඹ කොටස් හුවමාරුවේ ව්‍යාපාර අඛණ්ඩ සැළසුම්කරණ පරීක්ෂා කිරීම 2022 ජූලි අවසන් වන විටත් සම්පූර්ණ කිරීමට පැවතුණි.

ආ. ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේ වියදම රු. මිලියන 14.86 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු. මිලියන 16.92 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 1.94 ක හෙවත් සියයට 12.1 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

ඇ. 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ (පෙර පනත) 14 බි (2) අ වගන්තිය ප්‍රකාරව, ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධනය කිරීමේ අරමුණ සඳහා එම පනත යටතේ අයකරනු ලබන සෙස් බදුවලින් වියදම් දැරීමට බලය දී තිබේ. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන කටයුතු සඳහා රු. 55,241,934 ක් හෙවත් මුළු වියදමෙන් සියයට 11.1 ක් වැය කර තිබුණු අතර 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් එය සියයට 11.8 ක් හි සියයට 7.4 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 ප්‍රධාන මෙහෙයුම් කටයුතු පිළිබඳ නිරීක්ෂණ

--------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | මධ්‍යම පාර්ශ්වීකරණ යාන්ත්‍රණය (Central Counter Party Mechanism - CCP) ක්‍රියාත්මක කිරීමේ පියවරක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන භාරදීමට එරෙහිව ගෙවීම් (Delivery Versus Payment - DvP) ක්‍රමය 2018 වර්ෂයේ පළවන කාර්තුව අවසානයේදී සම්පූර්ණ කිරීමට සැළැසුම් කර තිබූ අතර එය 2019 වර්ෂයේ පළවන කාර්තුව දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කටයුතු 2021 දෙසැම්බර් 31 දින වන විටත් කෙරීගෙන යමින් පැවතුණි. | කොළඹ කොටස් හුවමාරුව, භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වන අතර, භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය පිළිබඳ විශේෂඥවරයාගේ සහයෝගය ඇතිව ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහායවීම, අවසන් කරන ලද ප්‍රතිපත්ති හා රීති සඳහා අවශ්‍ය අනුමැතියන් ලබා දීම සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම ආදිය කොමිෂන් සභාවේ කාර්යභාරය වේ.<br>භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පෙර, භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය සමඟ අනුගතව අවශ්‍ය වැඩිදියුණු කිරීම් කිරීමේ හැකියාව තැරැව්කාර පසු කාර්යාල ක්‍රමවලට ඇති බව කොළඹ කොටස් හුවමාරුව තහවුරු කළ යුතු අතර ඇණවුම් කළමනාකරණ පද්ධති වැඩිදියුණු කළ යුතුය. 2021 අගෝස්තු 16 වන විට මූලාරම්භය අවසන් කිරීමට දැඩිලෙස දායකවීමෙන්, සමස්ත ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා කොමිෂන් සභාවේ මැදිහත්වීම සටහන් කිරීම වැදගත් වේ.<br>කොළඹ කොටස් හුවමාරුවේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කොමිෂන් සභාව විසින් අවසන් | ඉලක්කගත කාලය ප්‍රකාරව ක්‍රියාවලි අවසන් කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| | කරන ලද මධ්‍යම පාර්ශවීකරණ යාන්ත්‍රණය හා ප්‍රතිපත්තිය අනුමත කළ අතර 2023 පළමු හෝ දෙවන කාර්තුවලදී එහි අවසානය අපේක්ෂා කරනු ලැබේ. | |
| ආ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14 බී (2) අ වගන්තිය ප්‍රකාරව, එම පනත යටතේ අයකරනු ලබන සෙස් බදුවලින් වියදම් දැරීමට බලය දී ඇති, ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනයට සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 36.1 ක් අයවැය ගතකර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී ඒ වෙනුවෙන් රු. මිලියන 14.8 ක් හෙවත් සියයට 41 ක් පමණක් දරා තිබුණි. | ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනය සම්බන්ධව රු.මිලියන 36.1 ක් වෙන් කර තිබුණු අතර එය, මාර්ග සංදර්ශන, තැරැව්කාර පසු හා ඇණවුම් කළමනාකරණ පද්ධති සඳහා ගෙවීම සහ ඒකක භාර සඳහා ප්‍රවර්ධන වැඩසටහන් යනාදි වශයෙන් ශීර්ෂ තුනක් යටතට අයත් විය. කොමිෂන් සභාවට තිබුණු මෙම ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල සැළසුම් සැලකිල්ලට ගෙන මෙම ඇස්තමේන්තු පිළියෙල කරන ලදි. කෙසේ වෙතත්, රට අගුළු දැමීම්, මහජනතාව රැස්වීමට සීමාකිරීම් හා සංවරණ සීමා සැලකිල්ලට ගෙන අපේක්ෂිත ක්‍රියාකාරකම් කිරීමට නොහැකි විය. | මෙම ක්‍රියාකාරකම් හැකි නම්, විකල්ප ක්‍රම මඟින් කිරීම අවශ්‍ය වේ. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ 2018 ජනවාරි 22 දිනට අනුමත කාර්ය මණ්ඩලයට අයත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනාරාල්, ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන අධ්‍යක්ෂක, විමර්ශන අධ්‍යක්ෂක, අධීක්ෂණ අධ්‍යක්ෂ, ආයතනික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ, නීති හා බලගැන්වීම් සහකාර අධ්‍යක්ෂ හා ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන සහකාර අධ්‍යක්ෂක යන තනතුරු 2022 ජූලි 31 දිනට පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. ප්‍රධාන කළමනාකරණ තනතුරු පරප්පාඩුව පැවතීම කොමිෂන් සභාවේ ඵලදායී ක්‍රියාකාරීත්වයට බලපෑ හැකිය. | කොමිෂන් සභාව, ඉහත දැක්වූ සියලු පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදි. මෙම තනතුරු සඳහා සුදුසු පුද්ගලයන් සොයා ගැනීමට කොමිෂන් සභාවට නොහැකි වූ බව ප්‍රකාශ කළ යුතුය. සුදුසු අපේක්ෂකයකු තෝරා ගත් විට එවැනි අයදුම්කරුවන්ට දෙනු ලබන අඩු වැටුප ප්‍රධාන වශයෙන්ම හේතුකොටගෙන ඔවුන් තනතුරු බාර ගැනීමට උනන්දුවක් නොදක්වයි. මේ වන විට, කොමිෂන් සභාව පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ පවත්වමින් සිටියි. | සාධාරණ කාලසීමාවක් තුළ මෙම පුරප්පාඩු පිරවීම අවශ්‍ය වේ. |
| ආ 2016 අප්‍රේල් 19 දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභාවේ එක් නිලධාරියෙකුගේ සේවය තහනම් කර තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 31.11 උප වගන්තියට පටහැනිව වාහන දීමනාව හා අනෙකුත් ප්‍රතිලාභ හැර ඔහුගේ මාසික දළ වැටුපෙන් හරි අඩකට සමාන මුදලක් | මෙහි සඳහන් රු. මිලියන 5.2 ක මුදල නැවත ගෙවීම සඳහා ලිඛිත සිහිකැඳවීම් කිහිපයක් අදාල නිලධාරියාට යවා ඇති බව කොමිෂන් සභාව සඳහන් කිරීමට කැමැත්තෙමු. ඔහු විසින් පිළිගැනීමක් | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශය අනුව අය කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම |

| | | |
|---|---|---|
| ගෙවීම් කර තිබුණි. 2016 අප්‍රේල් 20 සිට 2018 අගෝස්තු 31 දක්වා කොමිෂන් සභාව විසින් ඔහු වෙනුවෙන් දරන ලද අර්ධ මාසික වැටුප් වියදම රුපියල් 5,212,815 ක් විය. 2018 සැප්තැම්බර් 18 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (කෝප්) රැස්වීමේ නිර්දේශයට අනුව, කොමිෂන් සභාව වැටුප් ගෙවීම නැවැත්විය යුතු අතර ගෙවන ලද මුළු වැටුප අය කර ගැනීමට කටයුතු කළ යුතුය. ඒ අනුව, 2018 සැප්තැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි අර්ධ මාසික වැටුප ගෙවීම නවතා තිබූ අතර ඉහත සඳහන් මුදල ආපසු ගෙවන ලෙස 2018 නොවැම්බර් 15 දිනැති ලිපියෙන් නිලධාරියාට දන්වන ලදී. කෙසේ වෙතත්, කොමිෂන් සභාව විසින් 2022 සැප්තැම්බර් 6 දින වන විටත් එය අය කරගෙන නොතිබුණි. | (Acknowledgement) එවා තිබුණ ද ඔහු එම මුදල ප්‍රතිපූරණය කිරීමට අපොහොසත් වී ඇත. ඔහුට විරුද්ධව විනය පරීක්ෂණය තාමත් පවතින අතර විමර්ශන නිලධාරියාගෙන් හා පාර්ශවයන්ගෙන් යන දෙපාර්ශවයෙන්ම විමර්ශනය කඩිනමින් අවසන් කරන ලෙස කොමිෂන් සභාව අවස්ථා ගණනාවකදීම ඉල්ලා ඇත. | අවශ්‍ය වේ. |

**3.3 කොළඹ වරාය නගරයේ ප්‍රචාරණ ව්‍යාපාරය සඳහා කරන ලද ගෙවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 36 දරන (සංශෝධිත පරිදි) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ (පෙර පනත)13(කේ) වගන්තිය ප්‍රකාරව, සුරැකුම්පත් සම්බන්ධ වෙළඳපළට අදාලව රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවට බලය පැවරී ඇත. කොමිෂන් සභාව සමාලෝචිත වර්ෂය තුළදී රු. 8,821,948 ද මුදලක්, වරාය නගරය පිළිබඳව මහජනතාව අතර ඇති අපේක්ෂාවන් පිළිබඳ දැනුවත්බාවය ඇතිකිරීමේ අරමුණින් රජයේ ප්‍රචාරණ වැඩසටහනේ දායකත්වය ලෙස කොමිෂන් සභාව අධීක්ෂණය නොවන මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලබා දී තිබුණි. මෙම මුදල ගෙවීම, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත සම්මත වූ පසු අනුමත කළ ද, එය සම්මතවීමට පෙර එනම් 2021 අප්‍රේල් 15 දින අදාල අමාත්‍යාංශය එය ඉල්ලා තිබුණි. | 1987 අංක 36 දරන (සංශෝධිත පරිදි) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ (පෙර පනත) 13(කේ) වගන්තිය මඟින් කොමිෂන් සභාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය දැක්වේ. සුරැකුම්පත් වෙළඳපල සංවර්ධනය කිරීම පිළිබඳ රජයට උපදෙස් ලබාදීම හා සුරැකුම්පත් සම්බන්ධ වෙළඳපළට අදාලව රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවට බලය පැවරී ඇත. මුදල් හා ප්‍රාග්ධන වෙළඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය 2021.04.15 දිනැති ලිපිය මගින් කොළඹ වරාය නගරය පිළිබඳ දෘශ්‍යභාවය ඉහළ නැංවීම අරමුණුකරගත් යෝජිත වැඩසටහන පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කරන ලදි. ඒ අනුව, අමාත්‍යාංශය ආයෝජන මණ්ඩලයෙන්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් හා කොමිෂන් සභාවෙන් එම වැඩසටහන සඳහා පිරිවැය දැරීමෙන් සහායවන ලෙස ඉල්ලා ඇත. 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත ප්‍රකාරව, නියම කරනු ලැබිය හැකි නියම, කොන්දේසි හා කාර්යය පටිපාටිවලට යටත්ව, බලය ලත් තැනැත්තන් විසින්, නම් කරන ලද යම් විදේශ ව්‍යවහාර මුදලකින් වෙළඳ කටයුතු සිදු කිරීම සඳහා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යම් ව්‍යාපාර වස්තු. වටිනා ලෝහ | - |

හෝ භාණ්ඩ හුවමාරුවක් හෝ වෙළඳපලක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමට වරාය නගර කොමිෂන් සභාවට බලය පවරා ඇත. එබැවින්, කොළඹ වරාය නගරය තුළ  කොටස් හුවමාරුවක් ස්ථාපිත කරන අවස්ථාවේදී කොමිෂන් සභාව කොළඹ වරාය නගරය කොමිෂන් සභාව සමඟ එම කාර්යය නියාමනය හා සංවර්ධනය කළ යුතු වේ.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයිතම් 9 ක අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 27 සිට සියයට 101 දක්වා පරාසයක සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන්, එම අවස්ථාවලදී අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | රටෙහි පැවති තත්වය හේතුවෙන් කොමිෂන් සභාව සැළසුම් කරන ලද සමහර කටයුතු නොකරන ලදි. එබැවින්, ඇතැම් ශීර්ෂ යටතේ අයවැයගත ප්‍රමාණයන් භාවිතා නොකරන ලදි. කෙසේ වෙතත්, කොවිඩ් 19 අඩුකර ගැනීමෙන් කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහතික කිරීම පිණිස ප්‍රවාහන පහසුකම් සැපයීමට කොමිෂන් සභාව තීරණය කිරීම නිසා ප්‍රවාහනයට සම්බන්ධ අපේක්ෂිත වියදම සියයට 101 කින් අයවැයෙන් වෙන්කළ ප්‍රමාණය ඉක්මවා ඇත. කොමිෂන් සභාවේ වාහන අධික ලෙස භාවිතය ද මෙයට බලපා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, එවා සැලකිය යුතු කාලයක් භාවිතා කිරීම  හේතුකොටගෙන එම වාහන අලුත්වැඩියාවට ලක් කරන ලදි. එහෙයින්, සලකා බලන වර්ෂය තුළ දී ප්‍රධාන නඩත්තු කටයුතු හේතුවෙන් වාහන රක්ෂණ හා නඩත්තු පිරිවැය සියයට 27 කින් ඉහල යන ලදි. | අයවැය ලේඛනය සමඟ අනුකූලවීම අවශ්‍ය වේ. |